# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2488/10 - 2026 මැයි මස 12 වැනි අඟහරුවාදා - 2026.05.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වන අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ නින්දවූර් ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොටගෙන නින්දවූර් ප්‍රාදේශීය සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ නින්දවූර් ප්‍රාදේශීය සභාව අංක 5 - පුදුනගර් කොට්ඨාසයට තේරී පත් වූ මොහමඩ් මුස්තෆා මොහමඩ් අන්සාර් මහතා අයත් වන්නා වූ ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය නම් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම නින්දවූර් ප්‍රාදේශීය සභාව 5-පුදුනගර් කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා කුලන්දයිමරයිකාර් මොහමඩ් ජරිස් මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

නින්දවූර් ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, අත්තනායක මුදියන්සේලාගේ කසුන් ශ්‍රීනාත් අත්තනායක වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් කුලන්දයිමරයිකාර් මොහමඩ් ජරිස් මහතා, නින්දවූර් ප්‍රාදේශීය සභාව, අංක 5 - පුදුනගර් කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත්බව මෙයින් ප්‍රකාශ කරමි.

**කසුන් ශ්‍රීනාත් අත්තනායක,**
තේරීම්භාර නිලධාරි,
නින්දවූර් ප්‍රාදේශීය සභාව.

2026 මැයි මස 11 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
අම්පාර.

EOG 05 - 0155

1A - PG 7699 — 04 (2026/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*